www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප අපේක්ෂක විදුලිබල කම්කරුවන් අමතයි

## SEP candidate addresses power workers in Sri Lanka

**අපේ ලියුම්කරුවන් විසිනි**
**2009 මාර්තු 21**

පුද්ගලීකරනයට මග පාදන නීති සම්පාදනය සම්බන්ධ සාකච්ඡා කිරීමට කැඳවනු ලැබූ ශ්‍රී ලංකා විදුලිබල කම්කරුවන්ගේ රැස්වීමක දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සහ ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) ඉදිරිදර්ශන අතර දේශපාලන අගාධය කැපීපෙනෙන ලෙස ඉස්මතු වී ඇත.

ලංකා විදුලිබල මන්ඩලයේ සේවකයන් සම්බන්ධ අඟහරුවාදා පැවති ''විවෘත සංවාදය'' කැඳවනු ලැබුවේ ජවිපෙ ට සම්බන්ධ ලංකා විදුලි සේවක සංගමය (ලංවිසේස) සහ එහි සම්බන්ධීකරන සංවිධානයක් වන ලංවිම වෘත්තීය ඒකාබද්ධ පෙරමුන (ලංවෘසඒපෙ) විසිනි.

ආන්ඩුව විදුලිබල පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ මාර්තු 3 ලංවිම වෘසඒපෙරමුනේ සහ තත්වාරක්ෂක විරුද්ධ පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ (එජාප) වෘත්තීය සමිති ලෙඩ නිවාඩු දැමීට සහ විරෝධතා උද්ඝෝෂනයකට කම්කරුවන්ට කැඳවුම් කර තිබුනි. රැකියා, වැටුප් සහ සේවා කොන්දේසි ආරක්ෂා කෙරෙන බව සාවද්‍ය ලෙස ප්‍රකාශ කරමින් සෙසු සියලු සමිති පනතට සහයෝගය දුන්හ.

කම්කරුවන් අතර දිගටම පනත සම්බන්ධව විරුද්ධත්වයක් පවතින බව හොඳින් දන්නා වෘ.ස.ඒ.පෙ. මෙම සතියේ සංවාදය කැඳවා තිබුනේ එම විරුද්ධත්වය වාෂ්ප කරලීම සඳහා ය. දේශපාලන පක්ෂ සහ බහුජන සංවිධාන අතර විවෘත සංවාදයක් ලෙස රැස්වීම පිලිබඳ දැන්වීම පලකර තිබූ නමුත් රැස්වීම නියෝජනය කලේ ජවිපෙට සම්බන්ධ වෘත්තීය සමිති සහ සසප පමනි.

සසප සාමාජිකයෝ ''ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විදුලිබල ප්‍රතිසංස්කරන පනත සම්මත කරයි'' යන සිරස්තලය යටතේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පලවූ ලිපියේ පිටපත් පත්‍රිකාවක් ලෙස රැස්වීමට සහභාගිවූ කම්කරුවන් අතර බෙදූහ. කම්කරුවෝ 250ක් පමන සහභාගි වූහ.

ප්‍රධාන කථිකයන් වූයේ වෘසඑපෙ සභාපති රන්ජන් ජයලාල් සහ ජවිපෙට සම්බන්ධ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ (ජාවෘසම) සභාපති සහ ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන ලාල් කාන්ත ය. පනත පුද්ගලකරනය මග පාදන බව යලි යලිත් ප්‍රකාශ කල නමුත් දෙදෙනාගෙන් එක් අයෙකුවත් රැකියා සහ සේවා කොන්දේසි ආරක්ෂා කිරීමේ ඉදිරි දර්ශනය ඉදිරිපත් කලේ නැත.

''පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන විට ජනතාවගේ හදවත් යුද්ධය නැමැති සීතල වතුරෙන් හිරිවට්ටා තිබුන'' බව රන්ජන් ජයලාල් ප්‍රකාශ කලේය. වෙනත් වචනවලින් සඳහන් කලොත් දෙමල විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊයට) එරෙහි යුද්ධයේ දී මිලිටරි ජයග්‍රහනවලින් පසුව ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් අවුස්සනු ලැබූ ජයග්‍රහනවාදය මගින් කම්කරුවන් දුර්මුඛ කර තිබූ හෙයින් කම්කරුවන්ව බලමුලු ගැන්වීමට වෘත්තීය සමිතිය අසමත් වූහ.

''පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවිට වෘත්තීය සමිති දුර්වල වෙලයි තිබුනෙ. පාර්ලිමේන්තුවේ හෝ පලාත්සභාවල අපට ශක්තියක් නැතැයි'' ප්‍රකාශ කරමින් ලාල්කාන්ත ද සංශයවාදී කතාවක් කලේ ය. පසුව ඔහු මෙලෙස ගර්ජනා කලේය. ''අපට කල හැකිව පවතින්නේ පාරට බැහැලා පනත පරාජය කරන එක. අප පනත පරාජය කල යුතුයි. සහ කල හැකියි.'' එය කරන්නේ කෙසේදැයි ඔහු නොකීවේ ය. කම්කරුවන් වෙනුවෙන් නොපසුබස්නා සටන්කරුවන් ලෙස මවාපෑමට කරන මේ උත්සාහයන් මුලුමනින් ම වංචනිකය. වෘත්තීය සමිති විසින් සීමිත ලෙඩ නිවාඩු උද්ඝෝෂනයක් කැඳවුම් කර තිබීම සහ නායකත්වය කෙරෙහි විශ්වාසයක් නැතිකම නිසා මාර්තු 3 විරෝධතා ව්‍යාපාරය සාපේක්ෂව කුඩා ය. කම්කරුවන් මත ඇල්වතුර වත්කල රාජපක්ෂගේ වාර්ගික යුද්ධය කයෝර ලෙස ආරක්ෂා කලේ ජවිපෙ ය. ජයලාල්මත් මාධ්‍යවලට ප්‍රකාශ කලේ යුද ව්‍යාපාරයට බාධා වීම ගැන සැලකිලිමත් වීම නිසා වර්ජනයක් කැඳවුම් නොකල බවය.

රැස්වීමේ සංවිධායකයන් සංවාදයට කැඳවුම් කල විට බස්නාහිර පලාත් සභා ඡන්දසඳහා ඉදිරිපත් වී සිටින සසප අපේක්ෂකයෙකු සහ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ මාධ්‍යවේදියෙකු වන ඩබ්ලිව් ඒ සුනිල් මයික්‍රෆෝනය වෙත ගියේ ය. පනත මගින් විදුලිබල කම්කරුවන් සහ පාරිභෝගිකයන් කෙරෙහි ඇති කෙරෙන පීඩාකාරී බලපෑම සම්බන්ධව විවාදයක් නැති බව ප්‍රකාශ කරමින් ඔහු විවාදය ආරම්භ කලේ ය.

එසේ වුවත් කථිකයන් විසින් ප්‍රධාන ප්‍රශ්නය මගහැර ඇති බව ඔහු අවධාරනය කලේ යෑ රැකියාවලට සහ සෙසු අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරවලට සහ පුද්ගලීකරනයට විරුද්ධව සටන් කරන්නේ කෙහොම ද

''පනතට විද්ධව විරෝධතාව වැලැක්වීමේ ආන්ඩුවේ ක්‍රියාව ලංවිම කම්කරුවන්ට මෙන්ම සෙසු කම්කරුවන්ට ද කෙරෙන අනතුරු ඇඟවීමක් මාර්තු 3 විරෝධතා රැස්වීම වටකිරීම සඳහා අවම වශයෙන් 600ක් පමන පොලිස් බල ඇනියක් යොදවා සිටියා. කම්කරුවන් ලංවිම ප්‍රධාන කාර්යාලයට පා ගමනක් යෑමට උත්සාහ කල විට ඔවුන්ව අත් අඩංගුවට ගන්න බවට පොලීසිය තර්ජනය කලා. එහි ප්‍රතිපත්ති සම්බන්ධව කම්කරුවන්ගෙන් ඉදිරිපත් කෙරෙන මොනම විරුද්ධත්වයක් වත් ඉවසිය හැකි තත්වයක මේ ආන්ඩුව නොසිටිනා'' බව ඔහු කීවේය.

දැවැන්ත යුද වියදම සහ ගැඹුරුවන ගෝලීය ආර්ථික බිඳවැටීම මගින් නිෂ්පාදිත බරපතල ආර්ථික අර්බුදයකට රාජපක්ෂ ආන්ඩුව මුහුන දෙමින් සිටින බව සුනිල් විස්තර කලේය. ''ඇමරිකාව සහ යුරෝපය ඇතුලු ප්‍රධාන ධනපති රටවල බැංකු සහ ප්‍රධාන කර්මාන්තවල බිඳවැටීමක් අත් දකිමින් සිටිනවා. දස ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන්ට ඔවුන්ගේ රැකියා අහිමි වෙනවා. චීනයේ සංක්‍රමනික කම්කරුවන් විසි ලක්ෂයකට සහ ඉන්දියාවේ දස ලක්ෂයකට මේවනවිට රැකියා අහිමි වෙලා. ශ්‍රී ලංකාවේ ඇඟලුම් සහ සෙසු අංශවල කම්කරුවන් මුහුන පා සිටින්නේත් එම ඉරනමටමයි.''

සුනිල් තව දුරටත් සඳහන් කලේ ''විදුලිබල කම්කරුවන්ගේ අරගලය හුදකලා සටනක් නෙමෙයි. ලංවිම සහ සෙසු කම්කරුවන්ට තමන්ගේ රැකියා සහ සෙසු අයිතීන් ආරක්ෂා කර ගත හැකි වන්නේ ජාත්‍යන්තර අරගලයක කොටසක් ලෙස පමනයි.'' කම්කරුවන් එකමුතු කිරීම යනු සියලුම ආකාරයේ ජාතික වාදයන්ට හා වාර්ගිකවාදයන්ට එරෙහිවීම සහ ශ්‍රී ලංකාවේදී ආන්ඩුවේ යුද්ධයට සහ එමගින් නිර්මානය කර ඇති දෙමල විරෝධී ස්වොත්තමවාදයට විරුද්ධ වීම බව ඔහු අවධාරනය කලේය.

''රාජපක්ෂ ආන්ඩුව යුද ජයග්‍රහන යොදාගනිමින් කම්කරුවන් නිර්වින්දනය කර සහ කම්කරු පන්තිය දුර්වල කර ඇතිබව ජයලාල් සහ ලාල් කාන්ත ප්‍රකාශ කලා. ඔවු කම්කරු පන්තියේ අයිතීන්ට පහර දීමට සහ ඔවුන්ගේ අතෘප්තිය අවමංගත කිරීම සඳහා රාජපක්ෂ ආන්ඩුව යුද්ධය යොදාගෙන තිබෙනවා. නමුත් ඒ සම්බන්ධව ජවිපෙ දේශපාලනිකව වග කිව යුතුයි. රාජපක්ෂ බලයට පත් කරන්න ජවිපෙ උදව්කලා යුද්ධයට සහයෝගය දෙනවා පාර්ලිමේන්තුවේදී ආරක්ෂක අයවැයට සහ හදිසි නීතිවලට ඡන්දය දුන්නා. අනෙක් අතට ආන්ඩුව යුද්ධය සහ එම හදිසිනීති කම්කරුවන්ට විරුද්ධව පාවිච්චි කරනවා.''

මෙම අවස්ථාවේ දී රැස්වීම දේශපාලන වේදිකාවක් කර නොගන්නා ලෙස කියමින් ජවිපෙ ආධාරකරුවන් අතලොස්සක් සුනිල්ට බාධා කලහ. සංවිධායකයන් දෙසට හැරුනු සසප අපේක්ෂකයා මෙය සැබැවින්ම විවෘත සංවාදයක් දැයි ඔවුන්ගෙන් ඇසී ය. විශාල බහුතරයක් කම්කරුවන් අවධානයෙන් ඔහුගේ කථාවට ඇහුම්කන් දෙමින් සිටි තතු තුල සුනිල්ගේ කථාව දිගටම කරගෙන යෑමට ඉඩ දෙනවා හැර වෙනත් ඔවුන්ට විකල්පයක් නොවීය.

කොයිතරම් කටුක වුනත් තීරනාත්මක ප්‍රශ්න විවාදයට භාජන කිරීමේ සම්ප්‍රදායක් කම්කරු පන්තියට ඇති බව සුනිල් ප්‍රේක්ෂකයන්ට පැවසීය. ලෝක සමාජවාදී වෙබ් අඩවි ලිපියේ කතුවරයා තමන් බව හඳුන්වා දුන් සුනිල් කිසිවෙකු ට ඒ සම්බන්ධව විරුද්ධත්වයක් ඇත්නම් ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටියේ ය. ඔහුගේ අභියෝගය භාරගැනීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවීය.

සුනිල් යුද්ධයේ මූලයන් විස්තර කලේ ය. ''යුද්ධය ඇතුලු සියලුම දේශපාලන ප්‍රශ්න සම්බන්ධයෙන් ඓතිහාසික ප්‍රවිෂ්ටයක් කම්කරු පන්තියට තිබිය යුතුයි. මෙය කම්කරු පන්තියේ යුද්ධයක් නෙමෙයි. මෙම යුද්ධය 1948 සිට දෙමල මහජනතාවට කල වෙනස්කම්වල ප්‍රතිඵලයක්''

කම්කරු පන්තිය බෙදීම සඳහා වර්ගවාදය යොදාගත් ආකාරය පැහැදිලි කිරීමෙන් පසු කථිකයා මෙසේ සඳහන් කලේ ය. ''නිදහස් වෙලඳපොල ප්‍රතිසංස්කරන ක්‍රියාවට දැමීමට සමාන්තරව ශ්‍රී ලංකාවේ පාලක පන්තිය 1983 දී දෙමල මහජනතාවට විරුද්ධ යුද්ධය ආරම්භ කලා. උතුරු-නැගෙනහිර යුද්ධය පැවැති පසුගිය 25 වසර පුරාම සමස්ථ දිවයිනේ ම වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ට සහ ජීවන කොන්දේසිවලට පහර එල්ල කලා.''

2005 ජනාධිපතිවරනයේ දී දුන් සියලුම පොරොන්දු රාජපක්ෂ විසින් බිඳ දමා ඇතැයි සසප අපේක්ෂකයා පෙන්වා දුන්නේය. ''රට නැවතත් යුද්ධයට ඇද දැමීමෙන් පසුව රාජ්‍ය අංශයේ කම්කරුවන්ගේ, ගුරුවරුන්ගේ, සහ රැකියා විරහිත උපාධිධාරීන්ගේ ඉල්ලීම් ක්‍රමානුකූලව යටපත් කිරීමට පසුගිය වසර පුරාම ඔහු යුද්ධය යොදාගෙන ඇත.''

වාර්ගික ගැටුමේ සහ කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට සහ ජීවන තත්වයන්ට එල්ල කරන ප්‍රහාරයන්ගේ මූලය වන යුද්ධයට සහ ධනපති ක්‍රමයට කම්කරුවන් විරුද්ධ විය යුතු බව සුනිල් කීවේ ය. ''ආන්ඩුවට එරෙහි සිංහල. දෙමල සහ මුස්ලිම්

ජනයා එකමුතු කිරීමට උතුරු නැගෙනහිරින් හමුදා ඉවත් කිරීමට කම්කරු පන්තිය ඉල්ලා සිටිය යුතුයි. ජාත්‍යන්තර සමාජවාදය මත පදනම් වූ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමට ලංවිම සහ අවශේෂ කම්කරුවන්පෙරට ආයුතු ය'' යි අවධාරනය කරමින් සුනිල් සිය කතාව සමාප්ත කලේ ය.

සුනිල් කතාකර අවසන් වූ වහාම රැස්වීම නතර කලේය. ඔහු මතු කල ප්‍රශ්නවලට පිලිතුරු දීමට ජයලාල් හෝ ලාල් කාන්ත උත්සාහ නොකලේ ය. ප්‍රේක්ෂකයන් අතරින් කිසිදු ජවිපෙ ආධාරකරුවෙක් විවාදයට ඉදිරිපත් නොවීය. අතීතයේ දී සසප සාමාජිකයන්ට සහ ආධාරකරුවන්ට තර්ජනය කිරීමට සහ කායික ප්‍රචන්ඩත්වය පාවිච්චි කිරීමට ජවිපෙ නොපැකුලුනේ ය. එමෙන්ම හිස් සටන්කාමී වාචාල කතා පැවැත්වීමට ද ඔවුන්ගේ කථිකයෝ පසුබට නොවූහ. කෙසේ නමුත් වර්තමාන තත්වය තුල පුරසාරම්වලට වඩා දෙයක් අවශ්‍ය බව කම්කරුවෝ සිතති. සසප අපේක්ෂකයාට රැස්වීමේ දී ලැබුන අනුකූලතාවය පෙන්නුම් කරන්නේ විප්ලවවාදී සමාජවාදී විකල්පයක් ගැන සිතීමට කම්කරු පන්තියේ ඇති අභිලාෂයයි.

© www.wsws.org